බලංගොඩ අධ්‍යාපන කළාපය

නර්තනය - 7 ශ්‍රේණිය

II වාරය

නිපුණතා - පෙරහැර තේමා කර ගනිමින් සමූහ වාදනයක් නිර්මාණය කරමු.

පෙර වැඩ:- ප්‍රදේශයේ ආගමික පෙරහැරක් නරඹා තොරතුරු රැස් කිරීමට යොමු කිරීම



**ක්‍රියාකාරම**

**විකල්ප වාද්‍ය භාණ්ඩ ඇසුරින් තේමාවකට අනුව වාදන**

**<u>විවිධ ආගමික පෙරහැර</u>**

- මහනුවර දළදා පෙරහැර
- කතරගම ඇසළ පෙරහැර
- සමන් දේවාල පෙරහැර

**<u>පෙරහැරෙහි දක්නට ලැබෙන වාද්‍ය භාණ්ඩ</u>**

- යක් බෙරය
- ගැට බෙරය

- දවුල
- හොරණෑව
- තම්මැට්ටම
- තාලම්පට

මීට පෙර උගත් පද ඇසුරෙන් නොයෙක් ආකාරයට පද වාදනය සිදු කළ හැකි අගර තේමාවක් අනුව වාදනය කිරීම ද කළ හැකිය.

වටිනා සංස්කෘතික අංගයක් දෘශ්‍යමාන වන "පෙරහැර" තේමාව ලෙස ගනිමු. පෙරහැරක් මතකයට ගන්න. එහි නාදය පිළිබඳ හඬ අවධානයට යොමු කරන්න.ඈතින් එන පෙරහැරෙහි හඬට කන් දුන් අයුරු මෙනෙහි කරන්න.ඔබට ඇසුණු මුල් ම හඬ සිට අවසන් වන තෙක් ඇසුණු හඬ නැවත ආවර්ජනය කරන්න.

පෙරහැර පිළිබඳ කරුණු සාකච්ඡා කරන්න. කම හඬ උපදවන ආකාරයට විකල්ප වාද්‍යභ උපකරණයක් නිර්මාණය කර(ගොප් කොළ කීපයක් දිගට ඉරා(වෙන නොකර)) ගත හැකිය.

ඉන් පසු ව ගමේ පෙරහැරෙහි නම් පඬුරු පෙට්ටියක් සොලවමින් එන හඬ ඇසෙයි. ඒ වෙනුවට ටොනික් පියන්වලින් සෑදූ වළල්ලෙන් ප්‍රයෝජන ගත හැකි ය.

ඉන් පසු හේවිසි හඬ වෙනුවට ටින් බෙර, අයිස්ක්‍රීම් කෝප්පවලින් සෑදූ තම්මැට්ටම්, ගස්ගබු බටයෙන් සෑදූමලත් නළාව ආදිය ගැනීමට පුළුවන.

එසේම ගැමි නළුටුම්වල දී එකට ගැසීමෙන් ලී කෙළි තාල හඬට ද පොල්කටු එකට ගැසීමෙන් පතුරු නැටුමේ හඬට සමාන හඬක් උපදවා ගත හැකිය.

මේ ආකාරයට විකල්ප වාද්‍ය භාණ්ඩ හසුරුවා පෙරහැරක් සඳහා සමූහ වාදනයක් ඉදිරිපත් කළ හැකි ය.

පසු වැඩ

- පෙරහැරෙහි දක්නට ලැබෙන වාදන අවස්ථා නම් කරන්න
- පෙරහැරක වාදන අවස්ථා තේමා කර ගනිමින් සමූහ වාදන අංගයන් ප්‍රාසංගිකව ඉදිරිපත් කරන්න
- සමුහ වාදනයේ දී සාමූහිකව කටයුතු කිරීමේ වැදගත්කම් පිළිබඳ අදහස් ඉදිරිපත් කරන්න

සැකසුම:- බී.එස් වීරසිංහ

ර/ උඩගම මහා විද්‍යාලය